aat

Accounting Associate Level
Financial Accounting & Reporting

**Questions**

Scanned by TapScanner

## 2014 මාර්තු ප්‍රශ්න අංක 01

මාර්ගා ඇපරල් පීඑල්සී (මාඇපි) කොළඹට ආසන්න නගරයක පිහිටි ඇඳුම් නිෂ්පාදනයේ සහ විකිණීමේ නියුක්ත සමාගමකි. 2013 මාර්තු 31 දිනට මාර්ගා ඇපරල් පීඑල්සී හි ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු'000 හර | රු'000 බැර |
|---|---|---|
| | - | 15,000 |
| ප්‍රකාශකළ ප්‍රාග්ධනය | - | 8,750 |
| රඳවාගත් ඉපැයීම් - 2012 අප්‍රේල් 1 දින | - | 600 |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | 2,500 |
| රාජ්‍ය ප්‍රදානය | | - |
| දේපළ, පිරියත හා උපකරණ - පිරිවැයට: | 15,000 | - |
| ඉඩම් | 8,600 | - |
| ගොඩනැගිලි | 7,800 | - |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 4,650 | - |
| මෝටර් වාහන | 3,200 | - |
| ලී බඩු සහ උපකරණ | | |
| සමුච්චිත ක්ෂය - 2012 අප්‍රේල් 01 දිනට | - | 2,080 |
| - ගොඩනැගිලි | - | 2,900 |
| - පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | 1,625 |
| - මෝටර් වාහන | - | 1,210 |
| - ලී බඩු සහ උපකරණ | 4,800 | - |
| ස්වාධිකාර අයිතිය | 8,060 | - |
| තොග - 2013 මාර්තු 31 දිනට | 4,280 | 3,650 |
| ලැබිය යුතු වෙළඳ ණය / ගෙවිය යුතු වෙළඳ ණය | 880 | 660 |
| වෙනත් ලැබිය යුතු / වෙනත් ගෙවිය යුතු දෑ | 2,565 | - |
| මුදල් සහ බැංකු ශේෂ | 50,600 | - |
| විකුණුම් පිරිවැය | - | 88,800 |
| විකුණුම් | - | 1,200 |
| වෙනත් ආදායම් | - | 170 |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම - 2012 අප්‍රේල් 01 දින | 4,840 | - |
| බෙදාහැරීමේ පිරිවැය | 4,660 | - |
| පරිපාලන වියදම් | 1,000 | - |
| ගෙවූ අතුරු ලාභාංශ | 8,210 | - |
| ආදායම් බදු ගිණුම | 129,145 | 129,145 |
| | | |

පහත සඳහන් අමතර තොරතුරු ලැබී ඇත.

1. **දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය:**

   ශේෂ පිරික්සුමේ දැක්වෙන ප්‍රත්‍යාගණන සංචිත ගිණුම් ශේෂය මීට වර්ෂ දෙකකට පෙර පිරියත සහ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය නිසා ඇති වූවකි. 2013 මාර්තු 31 දින ඉඩම් රු. මිලියන 15.5 කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර අවශ්‍ය ගැලපීම් මෙතෙක් සිදුකර නොමැත.

2. **නව මෙහෙයුම් ඒකකය:**

   උතුරු මැද පලාතේ බකමූණ නැමැති ඇත ගම්මානයේ තම මෙහෙයුම් කරන සමාගම්වලට රජය ප්‍රදානයක් පිරිනමා ඇත. රු. මිලියන 5ක් වන මෙම ප්‍රදානයට සුදුසුකම් ලැබීමට නම් සමාගමක් එම ගමෙන් තරුණයින් 15 ක් වර්ෂ 5 ක් සඳහා සේවයේ යොදවා ගත යුතුය. 2012 ඔක්තෝබර් 1 දින සිට මාර්ගා ඇපරල් පීඑල්සී, මේ ගමෙන් තරුණයින් 20 ක් සේවයට බඳවා ගනිමින් අළුත් මෙහෙයුම් ඒකකයක් ආරම්භ කර ඇති අතර, මේ තරුණයින් අවම වශයෙන් වර්ෂ 5 ක් සේවයේ යෙදවීමට අපේක්ෂා කරයි. 2013 මාර්තු 31 න් අවසන් කාල පරිච්ඡේදය තුළ මෙම ප්‍රදානයෙන් කොටස් ගෙවීමක් ලෙස රු. මිලියන 2.5 ක් සමාගමට(මාඇපි) ලැබුණි.

   රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණයේදී සමාගම ආදායම් ප්‍රවේශය (income approach) අනුගමනය කරන බව උපකල්පනය කරන්න.



Scanned by TapScanner

3. **දේපළ , පිරියත හා උපකරණ :**

වර්ෂය තුල දේපළ, පිරියත හා උපකරණ වලට එකතු කිරීම් පහත දැක්වේ.

- 2012 සැප්තැම්බර් 30 දින බකමූණ පර්ශ්‍රය සඳහා රු.මිලියන 1.2 ක් පිරිවැයවූ යන්ත්‍රෝපකරණ මිලදී ගන්නා ලදී.
- 2012 ජූනි 30 දින සමාගම සතුව තිබූ එකම වාහනය, රු. මිලියන 3.2 ක් සාධාරණ වටිනාකම සහිත අළුත් වාහනයකට හුවමාරු කරන ලදී. ඊට අමතරව හුවමාරුවේ කොන්දේසි අනුව සමාගමට රු. 150,000 ක් ලැබුණි. මෙම හුවමාරුව වෙනුවෙන් තබා ඇති එකම ගිණුම් සටහන වූයේ ලැබුණ රු. 150,000 මෝටර් රථ ගිණුමට බැර කිරීම පමණි.

**සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් අනුපාතයන්ට ක්ෂය වෙන් කිරීම් කළයුතුය.**

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | වර්ෂයකට | 5% බැගින් |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | වර්ෂයකට | 20% බැගින් |
| මෝටර් වාහන | - | වර්ෂයකට | 25% බැගින් |
| ලී බඩු සහ උපකරණ | - | වර්ෂයකට | 20% බැගින් |

4. **ස්වාධිකාර අයිතිය:**

2012 අප්‍රේල් 01 දින සමාගම වර්ෂ 5 ක් සඳහා ස්වාධිකාර අයිතියක් අත්පත් කරගත් අතර ශේෂ පිරික්සුමේ සඳහන් මුදල සෑදී ඇත්තේ මෙසේය :

| | | |
|---|---|---|
| ස්වාධිකාරය හිමිකරුට ගෙවිය යුතු සම්පූර්ණ ගිවිසුම්ගත ගෙවීම | රු. මිලියන | 3.5 |
| ගෙවූ නීතිඥ සහ වෙනත් වෘත්තීයමය ගාස්තු | රු. මිලියන | 0.7 |
| හඳුන්වාදීමේ සහ ප්‍රවර්ධන ප්‍රචාරණ පිරිවැය | රු. මිලියන | 0.6 |
| | රු. මිලියන | 4.8 |

5. **දේපළ, පිරියත හා උපකරණ හාණිකරණය :**

2013 මාර්තු 31 දින කරන ලද හාණිකරණ පරීක්ෂාවේදී, වර්ෂය තුළදී මිලදීගත් පිරියත සහ යන්ත්‍රෝපකරණ හැර අනෙක් ඒවායේ නැවත අයකරගත හැකි වටිනාකම රු. මිලියන 2 ක් බව හෙළිදරව් විය.

6. **නියෝජනය පිට යැවූ භාණ්ඩ :**

සමාගමේ ණයට විකුණුම්වල, කොළඹ නියෝජිතයෙකුට විකිණීම හෝ ආපසු එවීම පදනම මත යවන ලද නිමි ඇඳුම් ඇතුලත්ය. මෙම නිමි ඇඳුම්වල පිරිවැය රු. 300,000 ක් වූ අතර, සමාගම විසින් නියමකර ඇති ඒවායේ විකුණුම් මිල රු. 390,000 කි. 2013 මාර්තු 31 දිනට නියෝජිතයා විසින් මෙම භාණ්ඩ විකුණා නොමැත.

7. **වෙළඳ ලැබිය යුතු ණය:**

රු. 20,000 ක මුදලක් බොල් ණය ලෙස ලියා හැරිය යුතුය. තවත් රු. 10,000 ක නිශ්චිත අඩමාණ ණය වෙන්කිරීමක් සහ 5% ක පොදු වෙන් කිරීමක්ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට කළ යුතුය.

8. **ආදායම් බදු**

වර්ෂය සඳහා ආදායම් බද්ද රු. මිලියන 8.8 කට ඇස්තමේන්තු කර ඇත. ශේෂ පිරික්සුමේ පෙන්වා ඇති ආදායම් බදු ගිණුමේ ශේෂය පහත පරිදි සකස් වී ඇත.

| | | |
|---|---|---|
| 2011/2012 තක්සේරු වර්ෂය සඳහා වැඩියෙන් ප්‍රතිපාදනය කිරීම | රු. | (220,000) |
| වර්ෂය තුල සිදුකල ගෙවීම් | රු. | 8,430,000 |
| ශේෂය | රු. | 8,210,000 |

ආදායම් බදු කාර්යය සඳහා බකමූණ පර්ශ්‍රය සඳහා මිලදීගත් යන්ත්‍රෝපකරණ වෙනුවෙන් 50% බැගින් ක්ෂයවීම් දීමනාවලට හිමිකම් ඇත. සමාගමේ බදු අනුපාතය 35% කි. මෙම වත්කම මත විලම්බිත බදු වෙන් කිරීමක් කළයුතුය.

ප්‍රකාශනය කිරීමේ කාර්යය සඳහා ඔබ පිළියෙල කළ යුතු දෑ:

(අ) 2013 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 10)

(ආ) 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 08)



Scanned by TapScanner

(ඇ) 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය. (ලකුණු 02)

(ඈ) දේපළ, පිරියත හා උපකරණ සංචලනයන් පෙන්වන ප්‍රකාශනය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## 2013 සැප්තැම්බර් ප්‍රශ්න අංක 02

2013 මාර්තු 31 දිනට පෙයාර් ට්‍රේඩ් පීඑල්සී හි ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

| | රු'000 හර | රු'000 බැර |
|---|---|---|
| ප්‍රකාශකල ප්‍රාග්ධනය | - | 8,000 |
| රඳවාගත් ඉපැයීම් - 2012 අප්‍රේල් 1 දින | - | 6,005 |
| ප්‍රත්‍යාගණන සංචිතය | - | 1,500 |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| ඉඩම් | 6,000 | - |
| ගොඩනැගිලි | 5,200 | - |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 4,800 | - |
| කාර්යාල උපකරණ | 3,200 | - |
| සමුච්චිත ක්ෂයවීම් - 2012 අප්‍රේල් 1 දින | | |
| - ගොඩනැගිලි | - | 1,085 |
| - පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | 1,520 |
| - කාර්යාල උපකරණ | - | 1,210 |
| මෝටර් වාහන සඳහා ගෙවූ මූල්‍ය කල්බදු වාරික | 375 | - |
| තොග - 2013 මාර්තු 31 දිනට | 4,260 | - |
| ලැබිය යුතු වෙළඳ ණය/ ගෙවිය යුතු වෙළඳ ණය | 3,200 | 3,840 |
| වෙනත් ලැබිය යුතු / ගෙවිය යුතු දෑ | 860 | 620 |
| මුදල් හා මුදලට සමාන දෑ | 2,075 | - |
| විකුණුම් පිරිවැය | 32,400 | - |
| විකුණුම් | - | 47,800 |
| අඩමාණ ණය සඳහා වෙන්කිරීම - 2012 අප්‍රේල් 1 දින | - | 95 |
| වෙනත් ආදායම් | - | 265 |
| බෙදාහැරීමේ පිරිවැය | 2,640 | - |
| පරිපාලන වියදම් | 3,820 | - |
| ගෙවූ අතුරු ලාභාංශ | 800 | - |
| ආදායම් බදු | 2,310 | - |
| | 71,940 | 71,940 |

පහත සඳහන් අමතර තොරතුරු ලැබී ඇත.

1. ප්‍රත්‍යාගණන සංචිතය
   2010 ඔක්තෝම්බර් 1 දින රු. මිලියන 1.8 ක පිරිවැයකට මිලදීගත් පිරියතක් 2013 මාර්තු31 දින රු. මිලියන 1.75 කට ප්‍රත්‍යාගණනය කරන ලදි. මේ වෙනුවෙන් තබා ඇති එකම සටහන වුයේ පිරියත සහ යන්ත්‍රෝපකරණ ගිණුම රු. 400,000 කින් හර කර ප්‍රත්‍යාගණන ගිණුම බැර කිරීම පමණකි. 2012 අප්‍රේල් 1 දින ප්‍රත්‍යාගණන ගිණුමේ ශේෂය රු. 1,100,000 ක් විය.

2. දේපළ , පිරියත සහ උපකරණ :
   2013 ජනවාරි 01 දින රු. 600,000 ක පිරිවැයට මිලදීගත් කාර්යාල උපකරණ අයිතමයක් පමණක් වර්ෂය තුලදී දේපළ, පිරියත සහ උපකරණ වලට එකතු වී ඇත.

   සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් අනුපාතයන්ට ක්ෂය වෙන් කිරීම් කළයුතුය.

   | | | | |
   |---|---|---|---|
   | ගොඩනැගිලි | - | වර්ෂයකට | 5% |
   | පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | වර්ෂයකට | 10% |
   | කාර්යාලය උපකරණ | - | වර්ෂයකට | 20% |

3. මූල්‍ය කල්බද්ද :
   සමාගම 2013 පෙබරවාර් 01 දින මූල්‍ය කල්බද්දක් යටතේ මෝටර් වාහනයක් ලබාගත් අතර, එයට අදාල විස්තර මෙසේය :
   - අත්පිට ගැණුම් මිල රු. මිලියන 4.8
   - සෑම මාසයක් අවසානයේම රු. 125,000 ක් වූ මාසික වාරික 48 කින් ගෙවා නිමකළ යුතුය.
   - මෝටර් වාහනයේ ආර්ථිකමය ප්‍රයෝජනවත් ජීවිත කාලය වර්ෂ 5 කි.
   - වර්ෂය තුල ගෙවූ මූල්‍ය කල්බදු වාරිකවල අඩංගු මුළු පොලිය රු. 210,000 ක් ලෙස උපකල්පනය කරන්න.



Scanned by TapScanner

4. තොග :
2012 මාර්තු 31 දිනට අවසාන බඩු තොගය, දෙවරක් ගණන් කිරීම හේතුවෙන් රු. 275,000 කින් වැඩියෙන් සටහන් වී ඇති බව දැන් සොයාගෙන ඇත. 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම වැරැද්ද නිවැරදි කළ යුතුව ඇත. 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී රු. 220,000 ක් පිරිවැය වූ බඩු තොග ගින්නකින් විනාශ විය. විනාශ වූ තොග සහ ලැබිය යුතු රක්ෂණය පිළිබඳ කිසිදු ගිණුම් සටහනක් පොත්වල සටහන් කර නැත. මේ වෙනුවෙන් රක්ෂණ සමාගම රු. 200,000 ක් ගෙවීමට එකඟ වී ඇතත් තවම ගෙවා නොමැත. තවද රු. 135,000 ක් පිරිවැයවූ භාණ්ඩ වර්ෂය තුල විකුණා ඇතත් මෙතෙක් ඉවත්කර නැති බැවින් ඒවා වැරදීමකින් 2013 මාර්තු 31 දින අවසාන තොගයට ඇතුලත්කර ඇත.

5. ලැබියයුතු වෙළඳ ණය :
බොල් ණය ලෙස කලින් ලියාහරින ලද රු. 60,000 ක ණය මුදලක් වර්ෂය තුලදී ආපසු අයකර ගෙන ලැබියයුතු වෙළඳ ණය ගිණුමට බැර කර ඇත. තවද ලැබිය යුතු වෙළඳ ණයක් සඳහා පෙර වර්ෂයේ රු. 20,000 ක නිශ්චිත වෙන් කිරීමක් ඇති කළ වෙළඳ ණයක්, වර්ෂය තුලදී අයකර ගත නොහැකි බව තහවුරු විය. හිඟව ඇති ලැබිය යුතු වෙළඳ ණය ශේෂයෙන් 5% ක අඩමාන ණය වෙන්කිරීමක් ඇතිකළ යුතුය.

6. වර්ෂය සඳහා ආදායම් බද්ද රු. මිලියන 2.8 කට තක්සේරුකර ඇත. පසුගිය වර්ෂයේ ආදායම් බද්ද රු. 240,000 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි. ශේෂ පිරික්සුම පරිදි ආදායම් බදු ගිණුම මෙසේ විය.

| | රු. |
|---|---|
| 2011/2012 ත/ව. සඳහා 2012 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද | 850,000 බැර |
| 2011/2012 ත/ව. සඳහා ආදායම් බදු සම්පූර්ණයෙන් බේරුම් කිරීම | (610,000) |
| 2012/2013 ත/ව. සඳහා ස්ව තක්සේරු ගෙවීම් | (2,550,000) |
| ශේෂ පිරික්සුම පරිදි ශේෂය | (2,310,000) හර |

ප්‍රකාශනය කිරීමේ කාර්යය සඳහා ඔබ පිළියෙල කළ යුතු දෑ:

(අ) 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 10)

(ආ) 2013 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(ඇ) 2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය. (ලකුණු 02)

(ඈ) දේපළ, පිරියත සහ උපකරණ සංචලනයන් පෙන්වන ප්‍රකාශනය. (ලකුණු04)

(මුළු ලකුණු 25)

**2013 මාර්තු ප්‍රශ්න අංක 03**

2012 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් ශේෂ පිරික්සුම එප්සිලොන් පීඑල්සී හි පොත්වලින් උපුටාගන්නා ලදී.

| | රු'000 හර | රු'000 බැර |
|---|---|---|
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය | | |
| - සාමාන්‍ය කොටස් 2,000,000 | | 21,000 |
| - 12% සමුච්චිත වරණීය කොටස් | | 5,000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 400 |
| රඳවාගත් ඉපැයීම් | | 12,500 |
| දේපළ, පිරියත හා උපකරණ : (පිරිවැයට) | | |
| - ඉඩම් හා ගොඩනැගිලි (ඉඩමේ අගය රු. මිලියන 13.2) | 23,400 | |
| - මෝටර් වාහන | 14,200 | |
| - යන්ත්‍රෝපකරණ | 4,150 | |
| - ලිබඩු සහ උපකරණ | 2,500 | |
| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන (2011.04.01 දින) | | |
| - ගොඩනැගිලි | | 860 |
| - මෝටර් වාහන | | 7,800 |
| - යන්ත්‍රෝපකරණ | | 1,840 |
| - ලිබඩු සහ උපකරණ | | 820 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය (2011.04.01 දින) | | 220 |
| අස්පෘශ්‍ය වත්කම් (2011.04.01 දින) | 2,500 | |
| තොග | 8,050 | |
| ලැබියයුතු වෙළඳ ණය /ගෙවියයුතු වෙළඳ ණය | 5,260 | 2,540 |



Scanned by TapScanner

| | | |
|---|---|---|
| වෙනත් ලැබියයුතු /ගෙවියයුතු දෑ | 620 | 1,200 |
| මුදල් හා මුදලට සමාන දෑ | 5,390 | |
| ගෙවූ ආදායම් බදු | 2,300 | |
| ගෙවූ අතුරු සාමාන්‍ය කොටස් ලා ංශ | 1,500 | |
| විකුණුම් | | 308,600 |
| විකුණුම් පිරිවැය | 262,000 | |
| පරිපාලන වියදම් | 12,450 | |
| බෙදාහැරීමේ පිරිවැය | 18,460 | |
| | 362,780 | 362,780 |

පහත සඳහන් අමතර තොරතුරු ලැබී ඇත.

1. - රු. මිලියන 1.2 ක් පිරිවැය වූ මෝටර් වාහනයක් 2006 මාර්තු 31 න් අවසන් වර්ෂයේදී මිලදීගෙන ඇති අතර, අනෙක් වාහන 2009 අප්‍රේල් 1 දිනට පසුව මිලදීගෙන ඇත.

   - ශේෂ පිරික්සුමේ දක්වා ඇති ප්‍රත්‍යාගණන සංචිතය 2010 වර්ෂයේදී කරන ලද යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයට අදාල වූවකි. 2012 මාර්තු 31 දින කරන ලද යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනයේදී යන්ත්‍රෝපකරණවල අගය රු. 900,000 ක් බව පෙන්නුම් කෙරෙණි. අවශ්‍ය ගැලපීම් මෙතෙක් කර නැත.

2. 2012.03.25 දින ගනුදෙනුකරුවෙකුට එක්තරා තොග අයිතමයක් මිලදීගැනීමට අවශ්‍ය වූ අතර, ඒ අවස්ථාවේ එය සමාගමේ තොගයේ නොවීය. කෙසේවෙතත්, සමාගම අදාල භාණ්ඩ තොග අයිතිමය 2012 අප්‍රේල් 10 වන දිනට ප්‍රථම භාරදීමට එකඟ වී, ඒවායේ විකුණුම් වටිනාකමෙන් 50% ක මුදලක්, එනම් රු. 120,000 ක් මුල් ගෙවීමක් ලෙස ලබාගත් අතර එම මුදල විකුණුම් ලෙස ගිණුම් ගතකර ඇත. මේ වෙනුවෙන් පොත්වල වෙනත් කිසිම සටහනක් තබානැත.

3. අස්පෘශ්‍ය වත්කම් වලින් නියෝජනය කරනුයේ වර්ෂ කිහිපයකට පෙර ලබාගෙන ඇති ස්වාධිකාර අයිතියක (patent rights) ක්‍රමක්ෂය නොවූ කොටසයි. අදාල අයිතිය එක්තරා නිෂ්පාදනයකින් ඒකක 12,000 ක් නිෂ්පාදනය කිරිම සඳහා වන අතර, 2011.03.31 දක්වා ඒවායින් ඒකක 10,000 ක් නිෂ්පාදනය කරනු ලැබූ අතර, 2012.03.31 න් අවසන් වර්ෂයේදී තවත් ඒකක 1,200 ක් නිෂ්පාදනය කර ඇත.

4. පසුගිය වර්ෂයේදී නිශ්චිත ප්‍රතිපාදනයක් සලසා තිබුණු රු. 30,000 ක ලැබියයුතු වෙළඳ ණය ශේෂයක් ලියා හැරිය යුතුය. ඊට අමතරව රු. 50,000 ක වෙළඳ ණය ශේෂයක් අයකරගත නොහැකි ලෙස ලියාහැර, ඉතිරිව ඇති ලැබියයුතු වෙළඳ ණය මත, 5% ක පොදු ප්‍රතිපාදනයක් ඇතිකළ යුතුය.

5. 2011.03.31 දින තොගය රු.120,000 කින් සාවද්‍ය ලෙස වැඩියෙන් සඳහන් කර ඇතිබව දැන් සොයාගෙන ඇත. මේ සම්බන්ධව කිසිම ගැලපීමක් තවම කර නොමැත.

6. 2012.03.30 දින සමාගම රු. 280,000 ක් පිරිවැයවූ තොග අයිතම් මිලට ගන්නා ලද අතර, කාර්ය සංවිධානයේ ප්‍රශ්න හේතුකොට රු. 35,000 ක අමතර අසාමාන්‍ය පිරිවැයක් දැරීමට සිදු විය. එසේ ගෙවන ලද මුළු මුදල (රු. 315,000) ගැණුම් ගිණුමට හර කර ඇති අතර, කිසියම් වරදක් නිසා මෙම අයිතම 2012.03.31 දිනට ඇති අවසාන බඩු තොගයට ඇතුලත් කර නැත.

7. දේපළ, පිරියත හා උපකරණ පහත සඳහන් අනුපාතයන්ට ක්ෂය කළයුතුව ඇත :

| | | |
|---|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | - | 5 % |
| මෝටර් වාහන වර්ෂයකට | - | 25 % |
| යන්ත්‍රෝපකරණ වර්ෂයකට | - | 20 % |
| ලී බඩු සහ උපකරණ වර්ෂයකට | - | 10 % |

8. වර්ෂය තුල ගෙවන ලද රුපියල් මිලියන 2.3ක ආදායම් බදු මුදලෙහි 2010 / 2011 තක්සේරු වර්ෂය සඳහා ඌන බදු ප්‍රතිපාදනය වෙනුවෙන් වූ රු. 150,000 ක් ඇතුලත්ය. 2011 / 2012 තක්සේරු වර්ෂය සඳහා ගෙවියයුතු ආදායම් බද්ද රුපියල් මිලියන 2.6 කට තක්සේරු කර ඇත. තවදුරටත්, රු. 40,000 ක විලම්බිත බදු වගකීමක් සඳහා ප්‍රතිපාදනයක් ඇතිකළ යුතුය.

ප්‍රකාශනය කිරීමේ කාර්යය සඳහා ඔබ පිළියෙල කළයුතු දෑ :

(අ) 2012 මාර්තු 31 න් අවසන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 10)

(ආ) 2012 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)



Scanned by TapScanner

(ඇ) 2012 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය. (ලකුණු 03)

(ඇ) දේපළ, පිරියත හා උපකරණ සංචලනයන් පෙන්වන ප්‍රකාශනය. (ලකුණු 03)

(මුළු ලකුණු 25)

**2012 සැප්තැම්බර් ප්‍රශ්න අංක 04**

2012 මාර්තු 31 දිනට රේන්බෝ පීඑල්සී හි ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

| | රු'000 හර | රු'000 බැර |
|---|---|---|
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 400,000 | | 4,000 |
| 2011 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 5,207 |
| ඉඩම් සහ ගොඩනැගිලි (ඉඩමේ වටිනාකම රු. මිලියන 7.5) | 9,700 | |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ - පිරිවැයට (කල්බදු රු. 500,000) | 2,400 | |
| මෝටර් වාහන - පිරිවැයට | 5,250 | |
| පරිගණක උපකරණ - පිරිවැයට | 1,950 | |
| 2011 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය | | |
| - ගොඩනැගිලි | | 850 |
| - පිරියත සහ යන්ත්‍රෝපකරණ (කල්බදු රු. 125,000) | | 1,050 |
| - මෝටර් වාහන | | 2,450 |
| - පරිගණක උපකරණ | | 480 |
| අප්පාශ්‍ය වත්කම් | 425 | |
| 2012 මාර්තු 31 දිනට තොග | 5,230 | |
| ලැබිය යුතු / ගෙවිය යුතු වෙළඳ ණය | 6,275 | 4,580 |
| 2011 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා නිශ්චිත ප්‍රතිපාදන | | 820 |
| අත්තිකාරම් සහ කලින් ගෙවීම් | 375 | |
| බැංකු අයිරාව | | 140 |
| දළ කල්බදු වගකීම | | 315 |
| 2011 අප්‍රේල් 01 දිනට අවිනිශ්චිත පොලී | 60 | |
| විකුණුම් | | 32,480 |
| විකුණුම් පිරිවැය | 19,320 | |
| වෙනත් ආදායම් | | 3,005 |
| පරිපාලන වියදම් | 2,435 | |
| බෙදාහැරීමේ වියදම් | 1,352 | |
| මූල්‍ය පිරිවැය | 105 | |
| ගෙවූ බදු | 645 | |
| 2011 අප්‍රේල් 01 දිනට බදු ප්‍රතිපාදනය | | 145 |
| | 55,522 | 55,522 |

(1) **දේපළ, පිරියත හා උපකරණ**

(අ) 2011 දෙසැම්බර් 31 දින සියළුම ඉඩම් සහ ගොඩනැගිලි රුපියල් මිලියන 11.7 ක වටිනාකමට ප්‍රත්‍යාගණනය (ඉඩමේ වටිනාකම රු. මිලියන 8.5) කළ අතර ගොඩනැගිලිවල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් ජීවිත කාලයේ වෙනසක් නොකරන ලදී,

2012 මාර්තු 31 දින සමාගම, ගම්පහ තිබුණ ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩම් සහ ගොඩනැගි අගයෙන් 25% ක් නියෝජනය කරන) රුපියල් මිලියන 2.975 කට මුදලට විකුණා, ලැබුණ සම්පූර්ණ මුදල වෙනත් ආදායම් වලට බැර කරන ලදී.

ප්‍රත්‍යාගණනය සහ ඉවත්කිරීම සම්බන්ධව වෙනත් කිසිම සටහනක් තබා නැත.

(ආ) 2012 ජනවාරි 01 දින, මෝටර් වාහනයක් රු. 90,000 කට සමාගමේ සේවකයකුට විකුණන අතර, එම මුදල මාස තුනක් ඇතුලත ඔහුගේ වැටුපෙන් අයකර ගන්නා ලදී. ඔහුට ගෙවන ලද ග වැටුප පරිපාලන වියදම් වලට හර කර ඇති අතර මෙම මෝටර් වාහනය පැවරීම සම්බන්ධ වෙනත් කිසිම සටහනක් පොත්වල තබා නැත. මෙම වාහනය සමාගම විසින් 2008 ජනවාරි දින රුපියල් මිලියන 1.2 ක පිරිවැයකට මිලදීගෙන ඇත.

(ඇ) ඉහත දක්වා ඇති "අත්තිකාරම් සහ කලින් ගෙවීම්" ශේෂයෙහි, 2010/2011 ගිණුම් වර්ෂ පරිගණක 25 ක් ඇණවුම් කිරීම සඳහා සමාගම ගෙවන ලද රු. 240,000 ක අත්තිකාරම් මු ඇතුලත්ය. 2011 ජූලි 01 දින පරිගණක සියල්ලම ලැබුණ අතර, එදිනම ඉතිරි ගෙවිය යුතු මු රු. 900,000 ගෙවා පරිගණක උපකරණ ගිණුමට හර කර ඇත. වර්ෂය තුළ වෙනත් පරිග උපකරණ කිසිවක් අළුතින් එකතුකර.නොමැත.



Scanned by TapScanner

(ඇ) සමාගම එහි දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග පදනම මත පහත පරිදි ක්ෂය කරයි:

| | |
|---|---|
| ගොඩනැගිලි වාර්ෂිකව | 2.5% |
| මෝටර වාහන වාර්ෂිකව | 20% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ වාර්ෂිකව | 12.5% |
| පරිගණක උපකරණ වාර්ෂිකව | 25%. |

(2) අස්පෘශ්‍ය වත්කමෙන් දැක්වෙනුයේ, ප්‍රචාරණය සහ ප්‍රවර්ධන කාර්යය සඳහා 'වෙබ් අඩවියක්' නිර්මාණය කිරීම මත වැය කරන ලද පිරිවැයයි.

(3) 2012 මාර්තු 31 දින සමාගමට රු. 140,000 ක් වටිනාකම ඇති නැව්ගත භාණ්ඩ තොගයක් ලැබී ඇති අතර එම ගණුදෙනුව සම්පූර්ණයෙන්ම පොත්වලින් මඟහැර ඇත. කෙසේ වෙතත්, මෙම භාණ්ඩ තොගය ඉහත දක්වා ඇති අවසාන භාණ්ඩ තොගයෙහි වටිනාකමට ඇතුලත්ය.

(4) සමාගමේ පරිචය වන්නේ නඩු මඟට බසින ලද ලැබීයයුතු වෙළඳ ණය සඳහා 100% ප්‍රතිපාදන ඇති කිරීමයි. 2009 වර්ෂයේදී සිල්වාට (වෙළඳ ණයගැතියකුට) විරුද්ධව ලැබිය යුතු ණය රු. 325,000 ක් සඳහා පැවරූ නඩුවේ තීන්දුව 2012 මාර්තු මාසයේදී ලැබී, සම්පූර්ණ මුදලම 2012 අප්‍රේල් 04 දින ඔහු විසින් ගෙවන ලදී.

රු. 80,000 ක වෙළඳ ණයගැතියෙකු වන පෙරේරා 2012 අප්‍රේල් මාසයේදී බුන්වත් විය.

(5) 2011 දෙසැම්බර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි සමාගම විසින් ගොඩනැගිල්ලක් රු. 15,000 ක මාසික කුලියකට වර්ෂ 1 ක කාලයක් සඳහා තාවකාලිකව කුලියට ගන්නා ලදී. මාස 04 ක කාලයක් සඳහා ගෙවූ ගෙවල්කුලිය සහ ආපසු ලබාගත හැකි රු. 10,000 ක තැන්පත් මුදල පරිපාලන වියදම්වලට හර කර ඇත.

(6) දළ කල්බදු වගකීම ලෙස දක්වා ඇත්තේ පසුගිය වර්ෂ වල මූල්‍ය කල් බද්දක් යටතේ ලබාගෙන ඇති යන්ත්‍රයකි. මාසික වාරිකය රු. 15,750 ක් වන අතර වර්ෂය තුල ගෙවූ වාරික 12 සම්පූර්ණයෙන් දළ කල්බදු වගකීම් ගිණුමට හර කර ඇත. වෙන කිසිම සටහනක් තබා නැත.

අවිනිශ්චිත පොලිය පහත සඳහන් පරිදි බෙදා වෙන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා | - | 2012 | රු. 25,000 |
| | - | 2013 | රු. 20,000 |
| | - | 2014 | රු. 15,000 |

(7) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බද්ද රුපියල් මිලියන 1.94 කට ඇස්තමේන්තු කර ඇති අතර, මෙම වර්ෂය තුල ගෙවූ බද්ද, 2010/2011 තක්සේරු වර්ෂය සඳහා අවසාන බද්ද ලෙස ගෙවූ රු. 185,000 කින් සහ ශේෂය 2011/2012 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරු බදු ගෙවීම් වලින්ද සමන්විත වෙයි.

ප්‍රකාශනය සඳහා ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළයුතුය :

(අ) 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(ආ) 2012 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(ඇ) දේපල, පිරියත හා උපකරණ වල සංචලනයන් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

**2012 මාර්තු ප්‍රශ්න අංක 05**

මොඩ් ටෙක් පීඑල්සී හි 2009 මාර්තු 31 දින උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | රු'000 හර | රු'000 බැර |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) (ඉඩම් පිරිවැය රු. 2,000,000) | 3,500 | |
| ලී බඩු හා සවිකිරීම් (පිරිවැයට) | 540 | |
| කාර්යාල උපකරණ (පිරිවැයට) | 1,600 | |
| මෝටර් වාහන (පිරිවැයට) | 2,400 | |
| සමුච්චිත ක්ෂය (2008.04.01 දිනට) | | |
| - ගොඩනැගිලි | | 275 |
| - ලී බඩු හා සවිකිරීම් | | 160 |
| - කාර්යාල උපකරණ | | 650 |
| - මෝටර් වාහන | | 350 |



Scanned by TapScanner

| | රු. '000 | රු. '000 |
|---|---|---|
| තොග | 920 | |
| විකුණුම් | | 12,450 |
| විකුණුම් පිරිවැය | 7,680 | |
| පරිපාලන වියදම් | 1,240 | |
| බෙදාහැරීමේ වියදම් | 680 | |
| ලැබිය යුතු වෙළඳ ණය/ ගෙවිය යුතු වෙළඳ ණය | 1,800 | 1,020 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය | | 45 |
| ආදායම් බදු | 560 | |
| ප්‍රකාශ කළ ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් 400,000 | | 4,200 |
| - වරණීය කොටස් 100,000 | | 1,000 |
| රඳවාගත් ඉපයීම් - 2008.04.01 | | 2,250 |
| 12% බැංකු ණය | | 800 |
| ගෙවූ සාමාන්‍ය කොටස් අතුරු ලාභාංශ | 300 | |
| මූල්‍ය වියදම් | 120 | |
| මිලදීගත් ප්‍රකාශණ හිමිකම (Copy right) | 1,000 | |
| බැංකුවේ මුදල් | 860 | |
| | 23,200 | 23,200 |

පහත සඳහන් තොරතුරු ලැබී ඇත.

(1) 2009 .03.31 දින අවසන් තොගයට පහත සඳහන් දෑ ඇතුලත් නොවේ.

(අ) සැපයුම්කරුවෙකුගෙන් මිලටගත් රු. 80,000 ක් පිරිවැය වූ භාණ්ඩ මාර්ගස්ථව පවතී. සමාලෝචිත වර්ෂය තුල මිලට ගැණුම් ගිවිසුම ක්‍රියාත්මක වී තිබුණ නමුත් අදාල ගිණුම් සටහන් තවමත් තබා නොමැත.

(ආ) රු. 50,000 කට මිල ලකුණු කර ' විකුණුමේ හෝ ආපසු එවීමේ ' පදනම මත යවා තිබූ බඩු , විකුණුම් ලෙස සලකා තිබුණි. මෙම තොගයේ පිරිවැය රු. 40,000 කි.

(ඇ) 2009 පෙබරවාරි මස ඇති වූ ගින්නකින් රු. 50,000 ක් පිරිවැය වූ භාණ්ඩ විනාශ විය. තොග රක්ෂණය නැත.

(2) වර්ෂය තුල දේපල, පිරියත හා උපකරණ වල වෙනස්වීම් :

(අ) 2009.01.01 දින රු. 300,000 ක පිරිවැයවූ කාර්යාල උපකරණ මිලට ගැනීම.

(ආ) 2007.04.01 දින රු. මිලියන 1 ක පිරිවැයට මිලදීගත් මෝටර් වාහනයක්, 2008.10.01 දින රු. මිලියන 0.8 ක සාධාරණ අගයක් සහිත වෙනත් වාහනයකට හුවමාරු කරගන්නා ලදි. මෙම හුවමාරුව වෙනුවෙන් කිසිදු ගිණුම් සටහනක් තබා නොමැත.

(3) දේපල, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පහත සඳහන් අනුපාතයන්ට ක්ෂය කළයුතුය.

| | |
|---|---|
| ගොඩනැගිලි වර්ෂයකට | 5% බැගින් |
| ලී බඩු හා සවිකිරීම් | 10% බැගින් |
| කාර්යාල උපකරණ වර්ෂයකට | 20% බැගින් |
| මෝටර් වාහන වර්ෂයකට | 25% බැගින් |

(මෝටර් වාහන බෙදාහැරීමේ කාර්යය සඳහා භාවිතා කරන බව සලකන්න)

(4) ශේෂ පිරික්සුමේ දක්වා ඇති ආදායම් බදු ගිණුම් පහත සඳහන් පරිදි සැදී ඇත.

| | රු. |
|---|---|
| 2007/2008 තක්සේරු වර්ෂය සඳහා අධි ප්‍රතිපාදනය | 40,000 (බැර) |
| 2008/2009 තක්සේරු වර්ෂය සඳහා ස්ව තක්සේරු මත ගෙවීම් | 600,000 (හර) |
| | 560,000 (හර) |

2009.03.31 අවසන් වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 720,000 කට ඇස්තමේන්තු කර ඇත.



Scanned by TapScanner

(5) 2009 මාර්තු මස මුලදී සමාගම විසින් සාමාන්‍ය කොටස් 80,000 ක් නිකුත් කිරීම සඳහා කොටසක් රු. 12.50 බැගින්වූ මිලකට අයදුම්පත් කැඳවනු ලදී. කොටසක නිකුත් මිල මුළුමනින් අයදුම්මේදී ගෙවිය යුතුවිය. කොටස් 96,000 ක් සඳහා අයදුම්පත් ලැබිණි. 2009 මාර්තු අගදී කොටස් 80,000 විභාජනය කරන ලදී. සමාගම, ලැබුණ සම්පූර්ණ මුදල සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම හැර වෙනත් කිසිදු ගැලපීම් සටහනක් මේ සම්බන්ධයෙන් තබා නැත. මෙම විභාජනයෙන් පසු නිකුත් කළ සම්පූර්ණ සාමාන්‍ය කොටස් ගණන 400,000 කි.

(6) වරණීය කොටස් හිමියන්ට, වර්ෂයකට කොටසක් සඳහා ශත 80 ක ලාභාංශයකට හිමිකම් ඇත.

(7) ලැබිය යුතු වෙළඳ ණය වලින් රු. 30,000 ක් අයකර ගත නොහැකි හෙයින් කපාහැරිය යුතුය. අඩමාන ණය සඳහා වෙන්කිරීම ඉතිරි හිග ශේෂයෙන් 5% කට ගැලපිය යුතුය.

(8) 12% බැංකු ණය මුදල රු. 20,000 බැගින් වූ සමාන මාසික වාරික වලින්, සෑම වාරිකයක්ම ගෙවන දින දක්වා හිඟ ණය ශේෂ මත ගණනය කළ පොලියද සහිතව ආපසු ගෙවිය යුතුය. සෑම වාරිකයක්ම මාසයේ අවසාන දිනයේදී ගෙවිය යුතුය. 2009 පෙබරවාරි මස අග දක්වා නියමිත පරිදි ණය ආපසු ගෙවා ඇත. 2009 මාර්තු වාරිකය (පොලියද සහිතව) සඳහා ප්‍රතිපාදනය කළ යුතුව ඇත.

(9) ප්‍රකාශණ අයිතිය 2007.04.01 දින රු. මිලියන 1.25 ක පිරිවැයට මිලදී ගෙන ඇති අතර, එහි ගිවිසුම්ගත කාලය එදින සිට වර්ෂ 5 කි.

ඔබ විසින් පහත සඳහන් දෑ ප්‍රකාශනය සඳහා උචිත ආකෘතියකට අනුව පිළියෙල කළ යුතුය.

(i) 2009 මාර්තු 31 න් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශනය (ලකුණු 09)

(ii) 2009 මාර්තු 31 දිනට සමාගමේ ශේෂ පත්‍රය (ලකුණු 10)

(iii) 2009 මාර්තු 31 න් අවසන් වර්ෂයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය (ලකුණු $2\frac{1}{2}$)

(iv) දේපළ, පිරියත හා උපකරණ සංචලනයන් දැක්වෙන ප්‍රකාශනය (ලකුණු $3\frac{1}{2}$)

(මුළු ලකුණු 25)



Scanned by TapScanner